07/09 2021 02:20 PM FAX
RECEIVED 07/09/2021 14:18
RECEIVED 07 SEP 2021 S.L.Customs P.P.& R. Division

# රජයේ නිවේදනයයි

## 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත

## 2 වැනි වගන්තිය යටතේ නියමය

2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් අමාත්‍ය බැසිල් රාජපක්ෂ වන මම, මෙහි උපලේඛනයේ 1 වන තීරයේ නිශ්චිතව දක්වා ඇති වෙළඳ භාණ්ඩය සම්බන්ධයෙන් ඒ උපලේඛනයේ 11 වන තීරයේ අනුරූප සටහන මගින් නිශ්චිතව දක්වා ඇති අනුප්‍රමාණය මත විශේෂ වෙළඳ භාණ්ඩ බද්දක්, මෙම නියමය මගින් පනවමි.

මෙම නියමය 2021 සැප්තැම්බර් මස ....08........ දින සිට ආරම්භ වන මාස 06 ක් දක්වා වූ කාල සීමාවක් සඳහා, 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධාන වලට යටත්ව, වලංගුව පැවතිය යුතුය.

2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ පනවන ලද 2021 අප්‍රේල් මස 13 දිනැති අංක 2223/2 දරන අතිවිශෙෂ ගැසට් පත්‍රය මගින් බොම්බයි ළූණු සඳහා ප්‍රකාශිත නියමය 2021 සැප්තැම්බර් මස ......08..........වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි අවලංගු කරමි.

බැසිල් රාජපක්ෂ
මුදල් අමාත්‍ය

2021 සැප්තැම්බර් මස ....07....... වන දින
කොළඹ 01,
මුදල් අමාත්‍යාංශයේදීය.

### උපලේඛනය

| 1 වන තීරය | | | | 11 වන තීරය |
|---|---|---|---|---|
| වෙළඳ භාණ්ඩය | | | | විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද |
| | සං. වි. ශීර්ෂය | සං. වි. සංකේතය | විස්තරය | |
| 1 | 07.03 | 0703.10.20 | බොම්බයි ළූණු | කි. ග්‍රෑමයට රු. 40/- |